බේරුවල ප්‍රාදේශීය සභාව - 2024

----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

බේරුවල ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.22 (ඊ) හා 3.23 ඡේද ප්‍රකාරව, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සංචිත ශේෂය දක්වා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ) ප්‍රමිතියේ 03 වන පරිච්ඡේදයේ 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.	-එම-	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය.
(ඇ) ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.15 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම යටතේ ස්ථාවර වත්කම් හීන වන ශේෂ ක්‍රමය අනුව ක්ෂය කර ඇති බව දක්වා තිබුණද එයට පටහැනිව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඈ) ප්‍රමිතියේ 9 වන පරිච්ඡේදයේ 9.9 ඡේදය ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන වියදම් සඳහා රජයෙන් කරන පැවරුම් මූලිකව වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතු අතර වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත් පැවරුම්වලින් අයභාරය ලෙස හඳුනාගත් වටිනාකම් වෙනත් විස්තීර්ණ ආදායමෙන් අඩු කළ යුතු වුවත්, එපරිදි හඳුනාගත් බව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් හෝ ඊට අදාල සටහන් 05 හා 10 මගින් අනාවරණය නොවුණි.	-එම-	-එම-

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී නොගත් රු.500,000 ක් වටිනා ට්‍රැක්ටර් රථ 02 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	හිමිකමක් නොමැති ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකළ යුතුය.

(ආ)	ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේදී ක්ෂය කළ වටිනාකමට සමාන ප්‍රමාණයක් ආදායමට එරෙහිව හඳුනා ගත යුතු වුවත් , එසේ කටයුතු නොකර රු.61,721,682 ක් පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස දක්වා තිබූ අතර විස්තීර්ණ ආදායම් යටතේ අතිරික්තයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලෙස රු.2,462,392 ක් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	වර්ෂ 02 කට වරක් කල් පිරෙන රු.575,000 ක් හා රු.100,000 ක් වූ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළිය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	-එම-	වර්ෂයට අදාල ආදායම ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	ස්ථාවර වත්කම්වලට අදාල සමුච්චිත ක්ෂය වෙනුවෙන් පොදු ලෙජරයේ වෙන් වෙන්ව ක්ෂය වෙන් කිරීමේ ගිණුම් පවත්වාගෙන යා යුතු වුවත් ස්ථාවර වත්කම්වලට අදාල සමුච්චිත ක්ෂය, සංචිත හා වෙන් කිරීම් ගිණුමට ගැලපීම් කර තිබුණි.	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඉ)	ජංගම ගිණුම් 03 ක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ සැකසීමේදී මුදල් පොත අනුව ශේෂය වෙනුවට වෙනත් අගයන් යොදා ගෙන තිබුණි.	-එම-	බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.

1.6.3 නොසැසඳූ පාලන ගිණුම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර නොසැසඳූ රු.3,267,919 ක වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ඉන්ධන දීමනා ලබා ගැනීමට හිමිකමක් නොමැති ක්ෂේත්‍ර නිලධාරීන් 12 දෙනෙකුට හා තාවකාලිකව බඳවාගෙන තිබූ නිලධාරියෙකුට එකතු වටිනාකම රු.666,076 ක් වූ ඉන්ධන ලීටර් 1,927 ක් ලබාදී තිබුණි.	පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙතින් උපදෙස් ඉල්ලා ඇති අතර 2025 ,ජනවාරි මස සිට ඉන්ධන දීමනා ගෙවීම අත්හිටුවා ඇති බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.53,226,523 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.8,048,882 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	29,069,868	29,317,455	32,967,628	12,866,227	25,918,429	25,600,161	34,037,739	15,835,000
(ii)	කුලි	20,197,646	21,704,530	23,401,372	1,636,251	23,255,552	19,086,953	17,124,743	3,848,205
(iii)	බලපත්‍ර ගාස්තු	712,000	898,979	985,979	25,000	4,133,000	4,233,205	4,184,806	793,400
		49,979,514	51,920,964	57,354,979	14,527,478	53,306,981	48,920,319	55,347,288	20,476,605

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හා බදු හිඟය රු.15,835,000 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,5,782,115 ක් හෙවත් සියයට 36 ක් අයකර නොතිබුණි.	ඉතිරි මුදල අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) කඩ කුලී		
(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට කඩ කුලී හිඟය රු.1,834,324 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.823,986 හෙවත් සියයට 44 ක් අයකර ගෙන නොතිබුණි.	හිඟය අය කර ගැනීමට හෝ නඩු පැවරීමට කටයුතු කරන බව.	-එම-
(ii) වර්ෂ 04 ක සිට පවතින හිඟ කඩ කුලී රු.689,762 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර නොතිබුණි.	රු.18,600 ක මුදලක් අයවී ඇති අතර ව්‍යාපාරික ස්ථාන හැර ගොස් ඇති බැවින් ඉතිරි මුදල ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව.	-එම-
(ඇ) වෙනත් ආදායම්		
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.11,452,577 ක් හා මුද්දර ගාස්තු රු.148,823,645 ක් විය.	ලැබීමට ඇති මුද්දර ගාස්තු සඳහා උපලේඛන සකසා දෙන ලෙස කළුතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය දැනුවත් කර ඇති බව.	-එම-

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කායර්සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාරික ස්ථාන 09 ක් එම බලපත්‍ර ලබා නොගෙන සිටියදීත් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට සභාව විසින් වෙළඳ බලපත්‍ර ලබා දී තිබූ අතර පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීමට සපුරාලිය යුතු අවශ්‍යතා දක්වමින් ප්‍රාදේශීය සභා ආඥා පනතේ 122 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි.	අතුරු ව්‍යවස්ථා සැකසීම සඳහා පළාත් පාලන දෙපාර්මේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව.	සභාවේ කටයුතු කාර්යක්ෂමව කිරීමට අවශ්‍ය නව අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ යුතුය.

(ආ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තියේ සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා යොදා ගන්නා හෝටල් සම්බන්ධව බලපත්‍ර ගාස්තු ලෙස ආදායමෙන් අය කළ යුතු ප්‍රතිශතය සහ වාර්ෂික ආදායමේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ ක්‍රමවේදය දක්වා නොමැති බැවින්, අනාගතයේ ආදායම් අයකර ගැනීමේ දී ඇති විය හැකි මතභේද වලකාලීම සඳහා ප්‍රාදේශීය සභා ආඥා පනතේ 223 වගන්තිය යටතේ හෝටල් සම්බන්ධ ආදායම් අය කර ගැනීමට අදාල අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.	පළාත් පාලන දෙපාර්මේන්තුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව.	-එම-

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජුලි 25 දිනැති අංක එල්ජීඩී/10 එෆ් /02/කේජ්එල්/2024 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය මගින් සභාවේ නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය මත සභා අරමුදලට සිදු වූ රු.561,147 ක මූල්‍ය අලාභයක් එයට වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගන්නා ලෙස දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එසේ කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ කමිටුවක් පත් කර ඉදිරි කටයුතු සිදු කරන බව.	යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2023 වර්ෂය සඳහා සැලසුම් කමිටු පැවැත්වීමේදී එකම දිනක එකම වේලාව තුල උප කාර්යාල 05 ක ඉල්ලුම්පත්‍ර සාකච්ඡා කර තිබුණද ඒ සඳහා අත්සන් ලේඛන 05 ක් සකස් කර කමිටු 05 ක් පැවැත්වූ ලෙස සලකා දීමනා ගෙවීම නිසා වැඩිපුර ගෙවීමෙන් සභා අරමුදලට වූ රු.486,000 ක අලාභයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.133,500 ක් පමණක් අය කර තිබූ අතර තව දුරටත් ගෙවිය යුතු පාර්ශ්ව අදාල මුදල් නොගෙවීමට එරෙහිව සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	විශ්‍රාම වැටුප් සැකසීමේදී සහ වෙනත් ආයතනවලින් අය කර එවන ලෙස දැනුම් දී ඇති බව.	සභා අරමුදලට සිදු වූ අලාභ කඩිනමින් අය කර ගත යුතුය.
(ඇ)	ප්‍රාදේශීය සභා රීති අංක 178(10) පරිදි විශේෂඥ උපදෙස් ලබා නොගෙන , නිවැරදි පිරිවිතර සකස් නොකර සහ නිවැරදි තාක්ෂණික ඇගයීමක් නොකර 2006 සැප්තැම්බර් 22 දින රු.869,500 ක් අත්තිකාරම් ගෙවා මිලදීගත් තාර උණු කිරීමේ යන්ත්‍රය 2006 නොවැම්බර් 17 දින සිට අක්‍රීය වී තිබීමත් එම යන්ත්‍රයට ගෙවූ අත්තිකාරම් මුදල සඳහා ලබාගත් බැංකු ඇපකරය උපලබ්ධි කර මුදල් ලබා නොගැනීමත් නිසා සභා අරමුදලට	2025 අප්‍රේල් 08 දින අදාල පාර්ශ්වයන්ට ගෙවීම් සිදු කරන ලෙස සිහිකැඳවීම් ලිපි යවා ඇති බව.	අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

රු.869,500 ක් පාඩු සිදු වූ ලෙස සලකා ප්‍රාදේශීය සභාවේ තනතුරු දරමින් සිටි නිලධාරීන් 07 දෙනෙකුට එරෙහිව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති විසින් අධිභාර සහතිකයන් මගින් අධිභාර පනවා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පළාත් පාලන කොමසාරිස් විසින් අධිභාර අයකර ගැනීමට ක්‍රියා කර නොතිබූ අතර ප්‍රාදේශීය සභාව ද ඒ පිළිබඳ සිහි කැඳවීම් කර සභා අරමුදලට සිදු වූ අලාභ අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දර්ගා නගරය උප කාර්යාලය පිහිටි අක්කර 02 රූඩ් 01 පර්චස් 10.72 ක් වූ රු.30,000,000 ක් වටිනා ඉඩමේ සමෘද්ධි බැංකුව හා තැපැල් කාර්යාලය ඉදි කර තිබූ අතර සභා පරිශ්‍රයේ වෙනත් ආයතන විසින් ගොඩනැගිලි ඉදි කිරීමට ලබා දුන් අනුමැතීන් හෝ ගිවිසුම්පත් සභාව සතුව නොතිබුණි. වත්කම් ලේඛනයේ මුළු ඉඩමේම වටිනාකම දක්වා තිබූ අතර මෙලෙස සභා සතු දේපළවල අනවසර ඉදි කිරීම් සම්බන්ධව සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගෙන එම ආයතනවලින් පිළිවෙලින් රු.4,671 ක් හා රු.11,677 ක් බැගින් වරිපනම් බදු අය කර තිබුණි.	සමෘද්ධි බැංකුව හා තැපැල් කාර්යාලය අනවසර ඉදි කිරීමක්ද යන්න පැහැදිලි පිළිතුරක් ලබා දීමට නොහැකි බව.	සභාව සතු දේපලවල ආරක්ෂාව සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	දර්ගා නගරය උප කාර්යාලය පරිශ්‍රයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලේ ඉහළ මාලය ගිවිසුම්ගතවීමකින් තොරව පොලිස් මුර පොලක් ලෙස ශ්‍රී ලංකා පොලිසිය විසින් භාවිතා කරන අතර එම ගොඩනැගිල්ලට අදාල සමාලෝචිත වර්ෂය සඳහා ජල බිල් ලෙස එකතුව රු.108,500 ක් සභාව විසින් ගෙවා තිබුණි.	2025 මැයි 31 සිට ජල සැපයුම විසන්ධි කිරීමට කටයුතු කරන බව.	සභාව සතු දේපල විධිමත්ව බදු දිය යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 දෙසැම්බර් 03 දිනැති LGD/13/2016(i) අංක දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව මාසික කඩ කුලිය සෑම වසර 03 කට වරක් රජයේ තක්සේරුකරුගේ හෝ වරලත් තක්සේරුකරුවෙකු ගේ තක්සේරුව මත ප්‍රතිශෝධනය විය යුතු වුවත්, අළුත්ගම සති පොලෙහි එළවළු කඩ 09 ක් හා සිල්ලර කඩ 09 ක් සඳහා 2015 වර්ෂයේ තක්සේරු කුලියම අය කර තිබුණි.	ඉදිරියේදී නව තක්සේරු වාර්තා ලබාගෙන දැනට ලබා දී ඇති කඩ කාමරවල කුලී වැඩි කිරීමට කටයුතු කරන බව.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
	ප්‍රධාන කාර්යාලය හා උපකාර්යාල සඳහා අවශ්‍ය කරන මෘදුකාංග පද්ධති 17 ක් මිලදී ගැනීම සඳහා 2018 මාර්තු සභාව විසින් පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබීම පිළිබඳව පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
(අ)	බේරුවල ප්‍රාදේශිය සභාව විසින් එම ආයතනය සමඟ එළඹි ගිවිසුමේ කොන්දේසි 04 ප්‍රකාරව ගිවිසුම්ගත වීමේදී මෘදුකාංග පද්ධතියේ වටිනාකමින් සියයට 50 ක්ද ,එය පරිගණක පද්ධතිය තුල ස්ථාපිත කිරීමෙන් පසු සියයට 25 ක්ද, ඉතිරි සියයට 25 සේවක පුහුණුවෙන් පසුද ගෙවිය යුතු විය. එසේ වුවද රු.495,000 ක් වූ වැටුප් කළමනාකරණ පද්ධතිය සහ රු.275,000 ක් වූ අන්තර්ජාලය හරහා ගාස්තු ගෙවා වෙන් කර ගැනීමේ වෙබ් අඩවි පද්ධතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් පරිගණක පද්ධතිය තුල ස්ථාපිත කර නොතිබුණද ස්ථාපිත කිරීමෙන් පසු හා පුහුණුවෙන් පසු ගෙවිය යුතු සියයට 50 වන රු.385,000 ක් 2018 මාර්තු 21 දින ගෙවා තිබුණි.	ඉදිරියේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව.	ගිවිසුමට පටහැනිව ගෙවීම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ආ)	හිඟ හිටි ආදායම් කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් රු.385,000 ක් ගෙවා තිබුණද හිඟ හිටි කඩ කුලී කාල විශ්ලේෂණ ආදී කළමනාකරණ තීරණ ගැනීමට අවශ්‍ය වාර්තා එම පරිගණක පද්ධතිය හරහා ලබා ගැනීමට හැකියාවක් නොතිබුණි.	කඩකුලී කාල විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමට නෙක්ෆා ආයතනයෙන් ඉල්ලුම් කර ඇති බව.	වැය කළ මුදලට සරිලන ප්‍රතිලාභ ලැබෙන පරිදි පද්ධතිය ඵලදායීව උපයෝජනය කළ යුතුය.
(ඇ)	සියළු ගිණුම් කළමනාකරණ පද්ධතිය, මානව සම්පත් කළමනාකරණ පද්ධතිය හා තොග ගබඩා කළමනාකරණ පද්ධතිය වෙනුවෙන් පිළිවෙලින් රු.495,000 ක් රු.295,000 ක් හා රු.695,000 ක් ගෙවා තිබුණද එම මෘදුකාංග සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.	නිලධාරීන්ට පුහුණුව ලබා දීමටත් , ප්‍රධාන කාර්යාලය හා උපකාර්යාල ජාලගත කිරීමට කටයුතු කරන බව.	පද්ධතිය ඵලදායීව උපයෝජනය කළ යුතුය.
(ඈ)	ටෙන්ඩර් කොන්දේසි අංක 08 ප්‍රකාරව පද්ධතිය එකින් එකට වෙන වෙනම ක්‍රියා කිරීමේ හැකියාව මෙන්ම තනි පද්ධතියක් ලෙසද ක්‍රියා කිරීමේ හැකියාව තිබිය යුතුය. එහෙත් වරිපනම් හා වෙනත් ආදායම් කළමනාකරණ පද්ධතීන් උපකාර්යාල සඳහා වෙන වෙනම ස්ථාපිත කර තිබුණද සභාවේ සමස්ථ ආදායම් කළමනාකරණයට අදාලව තොරතුරු ලබා ගැනීම සඳහා උපකාර්යාල හා ප්‍රධාන කාර්යාලය අතර පද්ධතීන් ඒකාබද්ධ	ඉදිරියේදී ජාලගත කිරීමේ කටයුතු සිදු කරන බව	-එම-

කිරීමක් සිදු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 වර්ෂයෙන් පසු ධාවන සටහන් ලියා නොමැති කුබෝටා අත් ට්‍රැක්ටරය පුද්ගලික ආයතනයකට අළුත්වැඩියාවට ලබා දුන් බවට දිනය හා අත්සන රහිතව ලොග් පොතෙහි දක්වා තිබුණ ද , නඩත්තුව සම්බන්ධයෙන් ගරාජය සමඟ හුවමාරු වූ කිසිදු ලියවිල්ලක් සභාව සතුව නොතිබූ අතර ස්ථාවර වත්කම් ලේඛනයේ ද වාහනයේ වටිනාකම ඇතුලත් කර නොතිබුණි. ගරාජය තුල එම වාහනයේ උපාංග ගලවා දමා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ද වාහනය අළුත්වැඩියා කර සභාවට ගෙන්වා ගෙන නොතිබුණි.	වත්කම් ලේඛනයේ සඳහන් නොවීම සම්බන්ධව නිශ්චිත පිළිතුරක් ලබා දිය නොහැකි බවත්, අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව.	බස්නාහිර පළාත් පාලන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	බස්නාහිර පළාත් පාලන සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු වෙරළ පිරිසිදු කිරීමේ රථය 2017 ඔක්තෝබර් 13 දින සිට ධාවන තත්ත්වයේ නොතිබුණි.	සභාවට මූල්‍ය ශක්තියක් නොමැති බැවින් අළුත්වැඩියාව කල් තබා ඇති බව.	අරමුදල් සම්පාදනය කරගෙන අළුත්වැඩියා කටයුතු කඩිනම් කළ යුතුය.
(ඇ)	සභාව භාවිතා කරන වාහන 06 ක් සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ද කටයුතු කර නොතිබුණි.	වර්තමානයේදී මූලික කටයුතු සිදු කර ඇති අතර ඉදිරියේදී එම ගැටළුව නිරාකරණය කරන බව.	වාහන නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 27 දිනැති අංක ජීඩී/දෙ.චක්‍ර/2020 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ සටහන් අංක 16 හි දේපල, පිරියත හා උපකරණවලට අදාල ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් මිලදී ගැනීම්, බැහැර කිරීම් හා ගැලපුම් , පිරිවැය හා ක්ෂය කිරීම් යටතේ පැහැදිලිව දක්වා නොතිබූ අතර සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් දීමනා වටිනාකම් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	ඉදිරි වර්ෂවලදී ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කරන බව .	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
දර්ගා නගරයේ පුස්තකාලය සඳහා රු.6,971,350 ක් වටිනා ලී බඩු හා උපකරණ මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලින් බැහැරව රාජ්‍ය	පැරණි ලී බඩු සහ උපකරණ විධිමත්ව භාරගත් බවට හෝ	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව මිලට ගැනීම් කළ

දැව සංස්ථාවෙන් මිලදී ගෙන තිබූ අතර පුස්තකාලයෙන් ඉවත් කරන ලද ලී බඩු හා උපකරණ නිසි පරිදි ගබඩාවට භාර දී නොතිබුණි.	භාර දුන් බවට සාක්ෂි නොමැති බව.	යුතු අතර ඉවත් කරන ලද භාණ්ඩ නිසි පරිදි ගබඩාවට භාර දිය යුතුය.

3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව කසළ වැසීම සඳහා පස් සපයා ගැනීමේ කොන්ත්‍රාත්තුව සැපයුම්කරුවෙකුට ලබා දී තිබූ අතර සපයන ලද පස් භෞතිකව පරික්ෂා කර මැණුම් කිරීමකින් තොරව පස් සැපයීම සඳහා වාහනය පැමිණි වාර ගණන අනුව ගණනය කිරීම් සිදු කර සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා සැපයුම්කරුට රු.5,821,000 ක් ගෙවා තිබුණි.	වැඩ අධිකාරි විසින් පරික්ෂා කර ගෙවීම් සිදු කර ඇති බව .	බාහිර පාර්ශවයකට කොන්ත්‍රාත් පැවරීමේදී ගිවිසුම්ගත විය යුතු අතර ගෙවීම් කිරීමේ නිසි අධීක්ෂණයක් හා පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය .
(ආ) බේරුවල, මොරගල්ල වෙරළ තීරයේ විදුලි කණු සිටුවීම හා පොකුරු රැහැන් ඇදීම සඳහා රු.24,985,879 ක් ද එම වෙරළ තීරය ආලෝකකරණය කිරීම සඳහා රු.2,802,244 ක් ද වශයෙන් සභාව වෙත ලැබී තිබුණු පළාත් සංවර්ධන ප්‍රදාන පිළිබඳ පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
(i) වෙරළ තීරය ආලෝක කිරීමේ ව්‍යාපෘතිය සඳහා සභාව විසින් රු.6,200,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකසා ප්‍රතිපාදන අනුමත කරවාගෙන තිබුණද, ඍජු ශ්‍රම පදනම යටතේ එම කාර්යය ඉටු කිරීමෙන් රු.3,397,756 ක් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ඍජු ශ්‍රම පදනම මත ඉටු කළ නිසා පිරිවැය ඉතිරි වූ බව.	ව්‍යාපෘති සඳහා අධි ඇස්තමේන්තු පිළියෙල නොකළ යුතුය.
(ii) වෙරළ තීරයේ ඉදි කරන ලද විදුලි ආලෝක පද්ධතිය 2024 ජුලි 13 දින විවෘත කර තිබූ අතර එම විවෘත කිරීමේ උත්සවය සඳහා දේශපාලන අධිකාරීන්ගේ නම් හා ඡායාරූප ඇතුලත් කර බැනර් 04 ක් සකස් කිරීම වෙනුවෙන් සභාව විසින් රු.150,000 ක් වැය කර තිබුණි.	ඇස්තමේන්තුවට බැනර් සඳහා වියදම ඇතුලත් වී නොමැති බව.	සභා අරමුදල් අනවශ්‍ය කාර්යය සඳහා මුදල් වැය නොකළ යුතුය.
(iii) ව්‍යාපෘති සඳහා මෙලෙස විශාල වැය බරක් දැරීමට ප්‍රථම එමගින් අත්වන මහජන සුභසාධනය සැලකිය යුතු වුවත් එමගින් ලැබෙන මහජන සුභසාධනයක් නොමැති බවත් වෙරළ ආශ්‍රිත හෝටල්වලට එමගින් ප්‍රතිලාභ අත්විය හැකි බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ ප්‍රතිලාභ භුක්ති විඳින හෝටල් 07 ක් 2020 වර්ෂයේ සිට සභාවට බලපත්‍ර ගාස්තු ද ගෙවා නොතිබීමෙන් නිතීමය පියවර ගැනීමට සභාවට සිදු වී තිබුණි.	සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සහ වෙරළ තීරයේ වෙළඳ කටයුතුවල සුභසාධනය වෙනුවෙන් ව්‍යාපෘති සිදු කළ බව.	ව්‍යාපෘතිවල ප්‍රතිලාභ මහජනතාව වෙත යාමට සැලසුම් සකස් කළ යුතුය.

3. 9 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් පුරප්පාඩු බව දක්වා තිබුණද 2023 ජුනි මස සිට සභාවට අනුයුක්ත කරන ලද කම්කරුවන් 30 ක් 2023 ජුනි සිට සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් වෙනත් රජයේ කාර්යාලවල සේවය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් ලෙස සභා අරමුදලින් රු.17,388,000 ක් ගෙවා තිබුණි.	2025 ජනවාරි 30 දිනැති ලිපිය මගින් එම සේවකයින් නැවත සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව.	සභාවේ කාර්යය සිදු නොකරන සේවකයින්ට සභා අරමුදලින් වැටුප් ගෙවිය නොහැක.
(ආ) 2022 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරියෙක් හා 2023 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගේ ණය ශේෂ එකතුව රු.834,838 ක් හා 2022 වර්ෂයේ සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ එකතුව රු.184,314 ක් අතරින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුල අය කර නොතිබුණි.	2025 මාර්තු 10 වන විට රු.210,200 ක් අය වී තිබූ අතර ඉතිරිය ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව.	නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදීම සේවක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුඅතර අනෙකුත් හිඟ ණය මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති බස්නාහිර පළාත් ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබඳ රීති අංක 08 ප්‍රකාරව එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය අනුගාමී මුදල් වර්ෂයේ පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 මාර්තු 06 දින ඉදිරිපත් කර තිබුණි.	විෂයභාර නිලධාරියා 2025.01.27 දින ස්ථානමාරු වී ගිය බව.	යොමුගත පනත් හා ගැසට් පත්‍ර ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් කර තිබූ මුළු අයවැයගත ප්‍රතිපාදනය රු.9,000,000 ක් වූ මාර්ග නඩත්තු හා සංවර්ධන ව්‍යාපෘති 11 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ මැතිවරණ කාල සීමාවකට මුහුණදීමට සිදු වූ බව .	වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති වර්ෂය තුල නිම කළ යුතුය.

4.3 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
බේරුවල ප්‍රාදේශීය සභාවේ විශාල වශයෙන් රැස් වන කසළ බැහැර කිරීම සඳහා දිගුකාලීන ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුල කසළ කළමනාකරණය වෙනුවෙන් රු.10,864,350 ක් වැය කර තිබුණි.	කොම්පොස්ට් අංගනයේ සහ බේල් යන්ත්‍රවල ධාරිතාවය ප්‍රමාණවත් නොවීම නිසා බාහිර සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමට සිදු වී ඇති බව.	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයට දිගු කාලීන ඵලදායී වැඩ සටහනක් සකස් කළ යුතුය.